# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2009/5 - 2017 මාර්තු මස 07 වැනි අඟහරුවාදා - 2017.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2017 මාර්තු මස 08 වැනි දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.09.15 දිනැති අංක 1984/26 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් සීනි (අනෙකුත්/ශුද්ධ නොකළ සංයෝජිත වර්ගීකරණ අංක 1701.12, 1701.13, 1701.14, 1701.91.10, 1701.91.90, 1701.99.30, 1701.99.90) සඳහා ප්‍රකාශිත අදළ නියමයන් 2017 මාර්තු මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය,

2017 මාර්තු මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදී ය.


1A- PG 003437 - 532 (2017/03)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*උපලේඛනය*

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| | | වෙළඳ භාණ්ඩය | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 01 | 03.03 | 0303.54 | මැකරල් (ස්කොම්බර් ස්කොම්බුස්. ස්කොම්බර් ඔස්ට්‍රාලසිකස්, ස්කොම්බර් ජැපොනිකස්) | කි. ග්‍රෑමයට රු. 6.00 |
| 02 | 07.13 | 0713.10.10 | සම්පූර්ණ-මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 0713.10.20 | පියළි කළ-මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 18.00 |
| 03 | | 0713.20.10 | සම්පූර්ණ-කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි. ග්‍රෑමයට රු. 7.00 |
| | | 0713.20.20 | පියළි කළ-කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි. ග්‍රෑමයට රු. 10.00 |
| 04 | | 0713.35.90 | අනෙකුත්-කව්පි | කි. ග්‍රෑමයට රු. 70.00 |
| 05 | 10.08 | 1008.21.10 | බීජ-කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.21.90 | බීජ -අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත්-කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.90 | අනෙකුත්-මිලට් | කි. ග්‍රෑමයට රු. 70.00 |
| 06 | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනික පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණ අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |
| | | 1701.12 | බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 1701.13 | උක් සීනි | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 1701.14 | අනෙකුත් උක් සීනි | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු | |
| | | 1701.91.10 | සීනි | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 1701.91.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි. ග්‍රෑමයකට රු. 15.00 |
| | | 1701.99.90 | අනෙකුත් | කි. ග්‍රෑමයකට රු. 15.00 |

03 - 1003

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.